දෙහිඕවිට ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 28 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | ගිණුම්කරණ නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමේ ශේෂය රු. 13,695 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සැපයුම් හා උපකරණ ණයහිමි ශේෂය රු.24,970 ක් වුවද, රු.743,326 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | පොදු සැපයුම් ණයහිමි එකතුව වන රු.743,326 ක මුදල සැපයුම් හා උපකරණ (603) ගිණුමේ සටහන් වී ඇත. එය 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබූ පිළිවෙලින් රු.80,084 ක හා රු. 61,715 ක වට්ටම් ගිණුම්ගත නොකිරිම නිසා පුස්තකාල පොත්වල වටිනාකම රු. | ලැබුණු වට්ටම් සහිතව පුස්තකාල පොත් ගිණුම් ගත කළ යුතුවේ. | විගණන වාර්තාවේ රු.593,124 ක් ලෙස සඳහන් වුවත් 2018 වර්ෂයේ මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් වල වටිනාකම රු.513,039 කි. පොදු ලෙජරයේ පුස්තකාල පොත් ගිණුමේ මිලදී ගැනීම නිවැරදි ප්‍රමාණයෙන් සටහන් වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | 141,799 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (iv) | රුපියල් 12,196,750 ක් වටිනා මෝටර් රථ 06 ක් හා යන්ත්‍රෝපකරණ විෂයයන් 04 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු වත්කම් ප්‍රාග්ධනිත කල යුතුවේ. | උපයෝගි ලේඛන වල ප්‍රමාණවත් තොරතුරු ගිණුම් සකස් කරන අවස්ථාවේ නොතිබීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත ගිණුමට ඇතුලත් විය යුතු ප්‍රමාණයන් අඩුවෙන් සටහන් වී ඇත. නිවැරදි උප ලේඛනයක් අදාල විෂය නිලධාරීන් වෙතින් ලබා ගෙන ප්‍රාග්ධන කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය තුල අරමුදල් ප්‍රභවයන් 04 ක් යටතේ ඉටුකල රු. 26,798,952 ක් වූ කර්මාන්ත වටිනාකම, මූලා මෙහෙයුම් ප්‍රකාශයට ගිණුම්ගතකර නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ හා ණයහිමියෝ රු. 25,317,252 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රාග්ධන ආධාර ගිණුම්ගත කළ යුතුවේ. | මෙම සභාව බාහිර පාර්ශවයන් යටතේ ලැබෙන අරමුදල් ප්‍රභවයන් මේ දක්වා තැන්පත් ගිණුම ආශ්‍රයෙන් සටහන් කර ඇත. එහෙත් 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන විට එකී අරමුදල් ජර්නල් සටහනක් මගින් ගැලපීමට කටයුතු කරමි. |
| (vi) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ 2016 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩවල වටිනාකම රු. 148,950 ක් ගිණුම් වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අදාල විෂය නිලධාරීන්ගේ විෂය ලේඛන සමඟ නිවැරදිව තහවුරු කර ගෙන 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (vii) | ඉකුත් වර්ෂයේ පෙන්වා දී තිබූ, රු. 3,141,410 ක් වූ ඉන්වෙන්ට්‍රි අයිතම 12 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අදාල විෂය නිලධාරීන්ගේ විෂය ලේඛන සමඟ නිවැරදිව තහවුරු කර ගෙන 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු පාලන ගිණුම්

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 08 ක මූලා ප්‍රකාශන හා උපයෝගී ලේඛන අතර රු. 20,166,631 ක වෙනසක් පැවතුණි. | මූලා ප්‍රකාශන හා උපයෝගි ලේඛන වල නිවැරදිතාවය තහවුරු කර ගත යුතුවේ. | උපයෝගි ලේඛන සමඟ පරීක්ෂා කර වෙනස්කම් නිරවුල් කිරීමට නියමිතය. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු.4,553 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු දී නැත. |

(ඈ) අසම්භව්‍ය බැරකම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් පැවරූ නඩු 14ක් සහ සභාව විසින් බාහිර පාර්ශවයන් 03 කට පැවරූ නඩු 17ක් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළ යුතුවේ . | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත භාවිතා කරමින් 2019වර්ෂයේ සිට අවසන් ගිණුම් සකස් කරන විට හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඉ) ගෙවිය යුතු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2010/11 වර්ෂ වලදී රැස්කළ එකතු කළ අගය මත බදු රු. 2,163,505 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු ගිණුම් වල දක්වා තිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | එකතු කල අගය මත බදු ගිණුමේ ශේෂය හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.2.4 අනුකූල නොවීම

1.2.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159 වගන්ති | වසර 01 ක් ඉක්මවා තිබූ එකතුව රු.3,704,943 ක් වූ වරිපනම් හා අක්කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි | පනත ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | වරිපනම් බදු හිඟය අයකර ගැනීමට පනත ප්‍රකාරව දේපල තහනම් කිරීමේ වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව කොට්ඨාශ අංක 01, අංක 02, අංක 03, අංක 06 යටතේ දේපල තහනම් කර ඇත.<br>අක්කර බදු අයකර ගැනීම සඳහා වත්කම් සතොයක්ෂණ කටයුතු සහ බදු එකතු කිරීමට ආයතනය මගින් පිළියෙල කරන ලද සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ 371 (5) | අවස්ථා 5 කදී ලබාදෙන ලද රු .134,650 ක් වූ අත්තිකාරම් 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | රු. 57,150 ක් 2019 මැයි 31 දින වන විට පියවා ඇති අතර මන්ත්‍රී ඉන්ධන දීමනා තොරණ ඉදි කිරීම් පිළිබඳ මුදල් 2019 වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| | (ii) මු.රෙ. 571 | 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු. 2,844,628 ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ රු.2,779,197 න් රු.871,872 ක් සහා ආදායමට ගෙන ඇති බවත් 2013 සිට ඉදිරියට ශේෂව පවත්නා තැන්පත් මුදල් සහා ආදායමට ගැනීමට කටයුතු කිරීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදයේ 1.6 වගන්තිය | ස්ථාන මාරුවී ගිය හා සේවය හැරගිය සේවකයන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.76,945 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විශ්‍රාම ගිය නිලධාරියාගේ ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිතය මගින් අයකර ගැනීමටත් ස්ථාන මාරු වී ගිය නිලධාරියාගේ ණය ශේෂය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසා බැලීමටත් සේවය හැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනාගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා දැනුවත් කර ඇති අතර ඇපකරුවන්ගෙන් අය කරගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවේ වාහන 04 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පරිදි ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයට අදාලව වාහන 15 ක් පවතින අතර ඉන් 8 ක් මේ වන විට ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇත. ඉතිරි වාහන 7ට මෝටර් බයිසිකල් 2 ක් ට්‍රැක්ටර් 2 ක් ත්‍රීවීල් රථයක් ජල බවුසරයක් හා JCB යන්ත්‍රයක් ඇතුලත්ව ඇති අතර ඉන් ධාවනයේ නෙයොදවන මෝටර් සයිකලය , ට්‍රැක්ටරය හා ඉන්ධන ලබා නොදෙන මෝටර් බයිසිකලය හැර ඉතිරි වාහන 4 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කර නැත. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 7,753,004 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,295,006 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,230,700 | 3,289,025 | 4,051,498 | 3,705,905 | 3,230,700 | 3,295,460 | 4,629,781 | 4,468,378 |
| කුලී | 5,955,650 | 6,083,257 | 5,645,519 | 1,929,353 | 8,186,792 | 5,761,318 | 5,942,348 | 1,491,615 |
| බලපත්‍ර ගාස්තු | 800,000 | 819,410 | 819,410 | 96,518 | 800,000 | 669,600 | 672,350 | 96,518 |
| වෙනත් ආදායම් | 55,743,600. | 59,322,822. | 55,912,973 | 37,376,957 | 53,602,300 | 45,487,931 | 40,228,387 | 33,967,107 |

### 2.2.2 ඉඩම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 සිට 2016 වර්ෂය දක්වා කාලය තුල කට්ටි කර විකුණන ලද බිම් කොටස් 122 ක තථ්‍ය විකුණුම් වටිනාකම වෙනුවට ඇස්තමේන්තු අගය පදනම් කර ගෙන සියයට එකක බදු මුදල් වශයෙන් රු. 895,284 ක් අයකර ගෙන තිබුණි. | තත්‍ය විකුණුම් වටිනාකම මත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ඉඩම්වල සත්‍ය විකුණුම් වටිනාකම ඔප්පු පරීක්ෂා කර වාර්තා කරන ලෙස ආදායම් පරීක්ෂක මහතුන්ට දන්වා ඇත. |

### 2.2.3 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) බැංකු සඳහා කුලියට දීමට යෝජිත තිබූ සභාව පිහිටි බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණයේ පළමු මහලේ වර්ග මීටර් 319.5 කින් යුත් පරිශ්‍ර 3 වැසිකිළි පහසුකම් සපයා නොමැතිවීම නිසා කුලියට දීමට නොහැකිව තිබීමෙන් අපේක්ෂිත රු.12,000,000 ක එක්වන් මුදල් හා වර්ෂයකට රු. 366,000 ක් බැගින් වූ කුලිය සභාවට අහිමිවී තිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදී එම අඩුපාඩු සකස් කර ටෙන්ඩර් කැඳවා එම කඩ කාමර කුලියට දී මුදල් අය කරගැනීමට අපේක්ෂා කරයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උක්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක රු. 5,256,640 ක්වූ එක්වන් මුදල් හා 2018 අගෝස්තු වන විට දඩ මුදල් ඇතුළුව හිඟ කඩ කාමර කුලිය, රු.7,783,797 ක් අයවීමට තිබුණු අතර කඩ හිමියන් සමඟ ගිවිසුම්ගත නොවීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බාධාවක් මෙන්ම අයකර ගැනීමේ අවධානමක් පැවතිණි. | නීති ප්‍රකාරව ගිවිසුම්වලට එළඹ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | එම කඩ කාමර ලබාගත් අය සමඟ සාකච්ඡා කර සියලු හිඟ මුදල් වාරික 39 කින් ගෙවීමට කටයුතු කරන ලෙස දැන් වූ අතර ඒ සඳහා එකඟතාවය පළකර කිහිප දෙනෙකු මේ වන විට ගෙවීම් කටයුතු සිදු කරයි. අනෙකුත් සියලු කඩ කාමර හිමියන් වෙත දැනුවත් කිරීමේ ලිපි යවා ඇති අතර ඒ අනුව ගිවිසුම් ගත වීමට කටයුතු සුදානම් කර ඇත. එසේ නොවුනහොත් එම ටෙන්ඩර් අවලංගු කර නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කර ඇත. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දින වනවිට මස් හා මාළු කඩවලින් අයවිය යුතු කඩකුලී රු. 125,276 ක් සහ දඩ මුදල් රු. 23,787 ක් වූ අතර එයින් රු. 93,980 ක් 1991 සිට 1997 දක්වා කාලයට අදාල අයවියයුතු ශේෂයන් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | 1991-1997 දක්වා කාලයට අදාල එම කඩහිමියන්ගේ නාම ලේඛනයක් අප සතුව තිබුණද මේ වන විට ඔවුන් එම ස්ථාන වල පදිංචි නැති අතර ඔවුන් ජීවත්ව සිටිනවාදැයි තහවුරු කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අදාල තොරතුරු ඉල්ලා ඉල්ලීම් ලිපියක් යවා ඇත. අනෙක් හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කල අතර දෙහිඕවිට ගවමස් කඩය පැරණි ටෙන්ඩරය අවලංගු කර දෙවන ටෙන්ඩර්කරු වෙත ලබා දී ඇත. |

2.2.4 බලපත්‍ර ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාලය නිශ්චිතව හඳුනාගෙන නොතිබූ ලැබියයුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 95,518 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | මෙම මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාළන සහකාර කොමසාරිස් කෑගල්ල වෙත යොමු කලද ඒ සඳහා ලේඛන යොමු කරන ලෙස දන්වා නැවත ආපසු එවා ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 9,958,326 ක් හා මුද්දර ගාස්තු රු. 20,900,000 ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | 2018 උසාවි දඩ මුදල් වලට අදාලව උපලේඛන වල වාර්තා කර ඇත්තේ 2018 ජනවාරි මස සිට 2018 ඔකතෝබර් මස දක්වා පමණි.2018 මුද්දර ගාස්තු වලට අදාල විස්තර ලැබී නොමැති අතර මේ සඳහා කඩිනමින් වාර්තා කර මුදල් ලබා ගැනීමට කටයුතු කිරීමට නියමිතය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| i | පළාත් පාලන ඇමතිවරයා විසින් 1988 වර්ෂයේදී ප්‍රසිද්ධකර තිබුණු අතුරු ව්‍යවස්ථා 42 න් අතුරු ව්‍යවස්ථා 15 ක් පිළිගෙන 2018 ජූලි 26 අංක 2082 හා දිනැති ගැසට් පත්‍රයෙහි පළකොට මාර්ගවල රථ වාහන නතර කර තැබීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව පනවාගෙන තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාලවන පරිදි අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඊට අනුකූලව කටයුතුකල යුතුවේ. | මාර්ග වල රථ වාහන නතර කර තැබීමේ අතුරු ව්‍යවස්ථාව සම්බන්ධව ත්‍රී රෝද රථ සංගම් දැනුවත් කිරීමේ වැඩසටහන 2019 පෙබරවාරි 20 දී පැවැත්වූ අතර ඇතැම් සංගම් බලපත්‍ර ලබානොගැනීම නිසා ලිපි මගින් ඔවුන් දැනුවත් කර ඇත. ආදාහනාගාර පාලනය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවට අදාලව කටයුතු සිදු කරනු ලබයි. |
| ii | ප්‍රචාරක දැන්වීම් පළ කිරීම සම්බන්ධව සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නොහැකි වී තිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාව ආණ්ඩුකාරතුමාගේ අත්සන සඳහා යොමු කර ඇත. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභාවට අයත් වරිපනම් ඒකක 2,101 ක් ඇතුලත් කොට්ඨාශ 05 කින් කසළ එකතු නොකිරීම නිසා මහජන පැමිණිලි හා විරෝධතා ඉදිරිපත් වී තිබුණද ඊට විසඳුම් ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවට අයත් සියළු ප්‍රදේශ ආවරණය වන පරිදි කසළ එකතු කළ යුතුවේ. | සභාවේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කර මේ වන විට අවුරුදු 3 ක් පමණ වේ.එහෙත් මේ දක්වා එහි ධාරිතාව වර්ධනය කිරීමට ගොඩනැගිලි ඉදි කර ගැනීමට හැකියාවක් ලැබී නොමැත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය වෙනුවෙන් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුවේ | තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ 2030 න්‍යාය පත්‍රය දැනුවත් කිරීමෙන් පසු 2018-2022 සිව් වාර්ෂික සැලැස්මට සහ 2019 වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇත. |

3.2 වත්කම් කළමනාකරණය

3.2.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වාර්ෂික සමීක්ෂණයකදී හදුනාගෙන තිබුණු අනවසර ඉදි කිරීම්, පදිංචිවීම්, පතල් කැනීම් ආදිය ඉවත් කිරීමට /වැලැක්වීමට, මායිම් සකස්කර සුරක්ෂිත කිරීමට සහ සභාවට ආදායම් උපයා ගැනීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම්, පදිංචි කිරීම්, පතල් කැනීම් ආදිය පිළිබඳව හා ඒවා ඉවත් කිරීමට, වැලැක්වීමට, මායිම් සකස් කර සුරක්ෂිත කිරීමට හා සභාවට ආදායම් උපයා ගැනීම ආදී කටයුතු සඳහා නීතිමය වශයෙන් කටයුතු කරනු ලබන අතර එවැනි අතපසුවීම් අවම කරගැනීමට කටයුතු කිරීමට නියමිතය. |

3.2.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශය සතු රු.18,113,220 ක් වටිනා වාහන 3 ක් සහ සබරගමුව පළාත් සභාව සතු රු.12,498,999 ක් වටිනා ට්‍රැක්ටර් 5 ක් හා කම්පැක්ටරයක් පවරා ගෙන ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි | වාහන පවරා ගැනීම විධිමත් පරිදි සිදු කර ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | වාහන පවරා ගැනීම විධිමත් පරිදි සිදු කර ඇත. |

3.3 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර රු.4,632,354 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇති අතර 2019 ජූනි මස පැවැත්වීමට නියමිත මුදල් කමිටුවට යොමු කර අනුමත කර ගැනීමට නියමිතය. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 39 ක රු.12,545,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා වැය විෂයයන් 17 ක රු. 16,695,000 ක ප්‍රතිපාදන වලින් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක්වූ එකතුව රු. 11,049,649 ක් උපයෝජනය කර නොතිබුණි. | වඩාත් ප්‍රයෝගික අයවැය සකස් කිරීමට හා එය මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ. |

.